# සති හයක් ඇතුළත පැලවත්ත සීනි සමාගමට කෝටි 29 ක් ගෙවීමට රජයට නියම කෙරෙයි

(යසවර්ධන රුද්රිගු, රංජන් කටුගම්පල)

පැලවත්ත සීනි සමාගම සමග එළඹගත් ගිවිසුමට අනුව එම සමාගමට ගෙවිය යුතු රුපියල් පනස්හත් කෝටි හැටපන් ලක්ෂයේ මුදලින් හරි අඩක් සති හයක් තුළ ගෙවන ලෙස රජයට ඊයේ නියම කළ ශ්‍රේෂ්ඨාධිකරණය ඉතිරි මුදල් ගෙවීම පිළිබඳව නියෝගදීම සඳහා අදාල පෙත්සම ලබන මස 24 දින යළි කැඳවන ලෙස වැඩි දුරටත් නියෝග කළේය.

මෙම නියෝගය නිකුත් කරනු ලැබුවේ ආචාර්ය රංජිත් අමරසිංහ, එස්. ඩබ්ලිව්. බී. වඩුගොඩපිටිය සහ ඩී. පී. එස්. ගුණසේකර යන විනිසුරුවරුන්ගෙන් සැදුම්ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලකි විසිනි.

කොළඹ 04, මෙල්බෝන් වීදියේ පිහිටි සීමාසහිත පැලවත්ත සීනි සමාගම විසින් මහභාණ්ඩාගාරයේ ලේකම් ඩික්සන් නිලවීර, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක, එම අමාත්‍යංශයේ ලේකම් පී. ඒ. සේනාරත්න යන මහත්වරුන් සහ නීතිපතිවරයා වග උත්තරකරුවන් කරමින් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමක් සලකා බැලීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය මෙම නියෝගය නිකුත් කළේය.

ජූලියස් සහ ක්‍රිසි නීතිඥ සමාගම මගින් ඉදිරිපත් කර තිබූ පෙත්සමේ මෙසේද සඳහන් විය.

1981 පෙබරවාරි මස 19 දින ඇරඹූ පැලවත්ත සීනි සමාගම වර්ෂයකට සීනි ටොන් 60,000ක් පමණ නිෂ්පාදනය කරන අතර එහි සේවකයෝ 7200ක් සේවය කරති. උක් වගාකරන ගොවියන් 8000කගේ ජීවන වෘත්තිය වන්නේ සමාගම සඳහා උක් වගා කිරීමයි.

සමාගමේ නිෂ්පාදන විකිණීම හා මිලදී ගැනීම පිළිබඳව සමාගම සමග රජය 1984-08-01 දින වසර 25 කට බලපැවැත්වෙන ප්‍රධාන ගිවිසුමක් අත්සන් කළ අතර 1993-10-11 දින තවත් අතිරේක ගිවිසුමක්ද අත්සන් කර ඇත.

මෙම ගිවිසුම් අනුව සමාගමේ ඉදිරි වර්ධනය රඳා පැවතුන අතර සමාගමට අවශ්‍ය පහසුකම් සැපයීමද සීනි මිළ වෙළඳ පොලේ අඩුවූ අවස්ථාවල නිෂ්පාදන මිල සහ වෙළෙඳ පොළ මිල අතර පරතරය රජය විසින් ගෙවිය යුතු බවද එහි දැක්වේ. තවද කිලෝ ග්‍රෑම් 50 ක සීනි බෑගයක් ඇමරිකානු ඩොලර් 50 කට අඩු නොවන මිලකට තොග අතිරික්ත වූ අවස්ථාවලදී 1992-04-01 දින සිට රජය මිලට ගෙන වෙළඳ පොළට නිකුත් කළ යුතුයැයිද ගිවිසුමේ සඳහන් වේ.

1996/97 වර්ෂවල සීනි මිල පහත නොවැටීම නිසා ගිවිසුම් ප්‍රකාරව රජයෙන් කිසිදු මුදලක් සමාගම ඉල්ලා නොසිටි නමුත් 1997 අප්‍රියෙල් 01 සිට 1998 මාර්තු 31 දින දක්වා රුපියල් 29,00,66,65 සහ 1998 මැයි 01 දින සිට 1998 ඔක්තෝබර් 31 දින දක්වා රුපියල් 28,24,96,602ක් මිල වෙනස වශයෙන් සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යංශයෙන් ඉල්ලා සිටියේය.

මෙම ගෙවීම් 1998-12-16 දින අමාත්‍යංශය නිර්දේශ කළ නමුත් සමාගමට මුදල් නොලැබුණි. ඉන්පසුව මුදල් ඉල්ලා පළමුවන වගඋත්තරකාර භාණ්ඩාගාර ලේකම්වරයාට 1999-01-08 දින සමාගම ලිපියක් යවන ලද අතර පසුව නීතිඥයන් මාර්ගයෙන් ලිපි යැවුවද පිළිතුරක් නොලැබිණි.

ඉන්පසුව 1999 මැයි මස 17 දින රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ ලේකම්වරයා සමාගමට ලිපියක් එවමින් පැලවත්ත සීනි සමාගම සමග අත්සන් කරන ලද ගිවිසුම් දෙක රජයේ ප්‍රතිපත්තිවලට එකඟ නොවන අතර නීත්‍යානුකූල නොවන බවද දන්වා තිබේ. මෙම ගිවිසුම් රටේ මහජන සුබ සිද්ධියට අහිතකර ලෙස බලපාන බැවින් ඒවා තවදුරටත් ක්‍රියාත්මක කළහොත් රටේ ජාතික ආර්ථිකයට පහර වදින නිසා රජය එම ගිවිසුම් අවලංගු කිරීමට තීරණය කළ බවද දන්වා තිබිණ.

බදු අය කිරීම් මගින් රටේ සීනි මිල පාලනය කිරීමට රජයට හැකි නමුත් එසේ නොකිරීමෙන් රටේ සීනි මිල පහළ වැටීම නිසා රජයෙන් මිල පරතරය අයකර ගැනීමට සමාගමට සිදුව තිබේ. මෙම ගිවිසුම් අවලංගු කළහොත් එයින් සමාගම වැසියාමේ තර්ජනයක් ඇතිවී සේවකයන්ගේ රැකියා නැතිව යාමද රටේ සීනි නිෂ්පාදනය විනාශ වීමද ආයෝජන ඉඩ ප්‍රස්තා ඇහිරීමද කොටස් හිමියන්ට අසාධාරණයක් සිදුවීමද හැර සමස්ත වශයෙන් රටේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන බව සමාගම ප්‍රකාශ කරයි.

එබැවින් 1, 2 හා 3 වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය නිසා සමාගමේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව ප්‍රකාශ කරන මෙන්ද අදාල ගිවිසුම්වල කොන්දේසිවලට එකඟව කටයුතු කරන ලෙසට වග උත්තරකරුවන්ට නියම කරන ලෙසද ගිවිසුම අවලංගු කරමින් එවන ලද 1999 මැයි 17 දිනැති ලිපිය වලංගු නැති බව ප්‍රකාශ කරන ලෙසද රුපියල් 57,65,63,767 මුදල ගෙවන ලෙසට රජයට නියෝග කරන ලෙසද රුපියල් දශ ලක්ෂයක වන්දි මුදලක් සහ නඩුගාස්තු ලබා දෙන ලෙසද පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

ඊයේ (02) මෙම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ සලකා බැලූ අවස්ථාවේදී රජය වෙනුවෙන් කරුණු දැක්වූ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් කේ. සිරිපාවන් මහතා අධිකරණය අමතමින් තමා අදාල කරුණු පිළිබඳව විවාද නොකරන නමුත් මෙම මුදල් නොගෙවා ඇත්තේ රජයේ මහා භාණ්ඩාගාරයේ ඒ සඳහා මුදල් නොමැතිවීම නිසා බව අවධාරණය කළේය.

දෙපාර්ශවයෙන්ම ඉදිරිපත් කළ කරුණු සැලකිල්ලට ගත් ශ්‍රේෂ්ඨාධිකරණය මෙම මුදල් ගිවිසුම් අනුව ගෙවිය යුතු බව පිළිගනිමින් ඒ අනුව ගෙවිය යුතු මුදල්වලින් අඩක් සති හයක් තුළ ගෙවන ලෙස 1, 2 හා 3 වන වගඋත්තරකරුවන්ට නියෝග කළේය. ඉතිරි මුදල් ගෙවීම පිළිබඳව නියෝගයක් දීම සඳහා පෙත්සම 1999-08-2[illegible] දින යළි කැඳවන ලෙස වැඩිදුරටත් නියම කළේය.

හිරාන් ද අල්විස්, හා[illegible] අමරසිංහ යන නීතිඥවරු සහ ජනාධිපති නීතිඥ රොමේෂ් සිල්වා මහතා පෙත්සම් වෙනුවෙන්ද නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සිරිපාවන් වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටියේය.